චක්‍රලේඛ අංක: .....26.../2011

මගේ අංකය: ඩබ්/08/2011
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2011.12.05

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

## සිරකරුවන් නිවාස නිවාඩු යැවීම හා බලපත්‍රමත මුදාහැරීම

යථෝක්ත වැඩපිළිවෙල පිළිබඳව කරුණු සොයා බලා කාලින වශයෙන් සිදුකලයුතු වෙනස්කම් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට පත්කරන ලද කමිටුවේ පහත සඳහන් නිර්දේශයන් වහාම ක්‍රියාත්මක කරන ලෙසට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් අංක MRPR/07/02/LB/2011 හා 2011.08.09 ද 2011.11.04 ලිපි මගින් දැනුම් දී ඇත. මින් ඉදිරියට පහතින් සඳහන් කර ඇති පරිදි කටයුතු කරන ලෙසට මෙයින් උපදෙස් දෙමි.

II. සිරකරුවන් නිවාස නිවාඩු යැවීම

නිවාස නිවාඩු යැවීම සඳහා සිරකරුවන් තෝරාගත යුත්තේ අධීක්ෂණ කමිටුවක් මගිනි. ඒ අනුව බන්ධනාගාර කොමසාරිස් අංක: ඩී4/නි.නි. හා 1974.05.10 දිනැති අංක 622 දරණ චක්‍රලේඛ නියෝග පරිදි නිවාස නිවාඩු යැවීමට සුදුසුකම් ලබන සිරකරුවන් තෝරා ගැනීමට ඔබ ආයතනය තුල පහත සඳහන් සංයුතියට අනුව පිහිටුවා ගනු ලබන අධීක්ෂණ කමිටුවකින් සිදුකල යුතුය.

1. බන්ධනාගාර අධිකාරී - කමිටු සභාපති
2. ප්‍රධාන ජේලර් - සාමාජික
3. ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරී - සාමාජික
4. විනය ජේලර් - සාමාජික
5. වෘත්තිය උපදේශක - සාමාජික
6. ප්‍රාදේශිය නිරීක්ෂක කමිටුව - සාමාජික (මොහු බලපත්‍ර අධීක්ෂණ කමිටු සාමාජික නොවිය යුතුය.)

- යම් සුභසාධක නිළධාරියෙකු මෙම කමිටුවට ක්ෂේත්‍ර විමර්ශන වාර්තාවක් සපයා ඇත්නම් ඔහු එම කමිටු රැස්වීම් වාරයට සහභාගි නොවිය යුතු අතර අවශ්‍යතාවයක් ඇතිවුවහොත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

මෙම කමිටුවේ නිර්දේශය මත ඉදිරියේදී සැකසෙන නිවාස නිවාඩු අයදුම් පත්‍රය ඇමුණුම 01 පරිදි සංශෝධනය විය යුතුය. මින් ඉදිරියට එකි ආකෘති පත්‍රය භාවිතා කලයුතු අතර එහි අඩංගු කෙරෙන තොරතුරු වාර්තා කිරීමේදී සුභසාධක නිළධාරී විසින් එහි නිරවද්‍යතාවය තහවුරු කලයුතු අතර එම කරුණු සාවද්‍ය බවට තහවුරු වුවහොත් එම නිළධාරින්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කිරීම සිදු කෙරේ.

## 02. සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීම

සිරකරුවන් බලපත්‍ර මත මුදාහැරීමට සලකා බැලීම පිණිස බලපත්‍ර මණ්ඩලය වෙත සිරකරු ඉදිරිපත් කල යුත්තේද පහත සඳහන් සංයුතිය පරිදි පිහිටුවා ගනු ලබන අධීක්ෂණ කමිටුවක නිර්දේශය පරිදිය.

අධීක්ෂණ කමිටුව

1. බන්ධනාගාර අධිකාරී - කමිටු සභාපති
2. ප්‍රධාන ජේලර් - සාමාජික
3. ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරී - සාමාජික
4. විනය ජේලර් - සාමාජික
5. වෘත්තිය උපදේශක - සාමාජික
6. ප්‍රාදේශිය නිරීක්ෂක කමිටුව - සාමාජික (මොහු නිවාස නිවාඩු අධීක්ෂණ කමිටු සාමාජික නොවිය යුතුය.)

- යම් සුභසාධක නිළධාරියෙකු මෙම කමිටුවට ක්ෂේත්‍ර විමර්ශන වාර්තාවක් සපයා ඇත්නම් ඔහු එම කමිටු රැස්වීම් වාරයට සහභාගි නොවිය යුතු අතර අවශ්‍යතාවයක් ඇතිවුවහොත් කරුණු ඉදිරිපත් කිරීමට සූදානමින් සිටිය යුතුය.

2. අධීක්ෂණ කමිටුවේ නිර්දේශය මත බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීමේදී සුභසාධක නිළධාරී විසින් දැනට සම්පූර්ණ කෙරෙන

   1. ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණ වාර්තාව
   2. ක්ෂේත්‍ර විමර්ශන වාර්තාව
   3. අධිකාරී වාර්තාව

   මෙම වාර්තා වලට අදාල ආකෘති පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

1. ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණ වාර්තාව

* මෙම වාර්තාවේ අංක 03 යටතේ සිරකරුගේ ස්ථිර ලිපිනය සටහන් විය යුතුය. වෙනත් පදිංචියකට යන්නේනම් එසේ පදිංචියට යන ලිපිනය පැහැදිලිව සඳහන් වන පරිදි ආකෘති පත්‍රය වෙනස් කල යුතුය.
* ඊට අමතරව ග්‍රාම සේවා නිළධාරී වසම, ප්‍රාදේශිය කොට්ඨාශය හා පොලිස් වසම සඳහන් වන පරිදි සංශෝධනය විය යුතුය.
* ආකෘති පත්‍රයේ අංක 19 මගින් දැක්වෙන තොරතුරු මූලාශ්‍ර වල සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය සටහන් කලහැකි පරිදි සංශෝධනය විය යුතුය.
* අංක 20 හා 21 හි තොරතුරු සටහන් කිරීමේදී අදාල පුද්ගලයින්ගේ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කල හැකි පරිදි සංශෝධනය විය යුතුය.(ඇමුණුම 02 සංශෝධිත ආකෘතිය)

2. ක්ෂේත්‍ර විමර්ශන වාර්තාව

සුභසාධක නිළධාරී විසින් නව ක්ෂේත්‍ර විමර්ශනයේදී ප්‍රාථමික සම්මුඛ පරීක්ෂණ වාර්තාවේ ඉදිරිපත් කරන සියලු කරුනු ගැඹුරින් අධ්‍යයනය කර තහවුරු කරගත යුතු අතර ඒවායේ වෙනසක් ඇත්නම් පැහැදිලි නිරීක්ෂණය ඉදිරිපත් කල යුතුය. ඊට අමතරව සිරකරුවන් බලපත්‍ර මත නිදහස් කිරීම නිර්දේශ කරන්නේද/නැද්ද යන්න පැහැදිලිව සහතික කල යුතුය.

දැනට සමහර සුභසාධක නිළධාරීන් ඉදිරිපත් කරනු ලබන අසම්පූර්ණ හා සාවද්‍ය ක්ෂේත්‍ර වාර්තා නිසා ගැටළු සහගත තත්වයන් රැසක් මතුවී ඇත. බලපත්‍ර මණ්ඩලයේ දෝෂ දර්ශනයටද ලක්විම කණගාටුදායක තත්වයකි. මෙම තත්වයන්ගෙන් බැහැර වී සත්‍ය කරුණු සහිත සම්පූර්ණ ක්ෂේත්‍ර වාර්තා ඉදිරිපත් කිරීමට සුභසාධක නිළධාරීන් කටයුතු කල යුතුය. විශේෂයෙන්ම සුභසාධක නිලධාරී විසින් වින්දිතයාගේ පාර්ශවයෙන්ද කරුනු වාර්තා ගතකල යුතුය. එසේම ක්ෂේත්‍ර විමර්ශනයේදි මින් ඉදිරියට ප්‍රදේශයේ ග්‍රාම නිළධාරිද හමුවී තොරතුරු වාර්තා කරගත යුතුය. ඊට අමතරව ග්‍රාමයේ ආගමික පූජකවරුන්, විදුහල්පතිවරුන්, අසල්වාසීන් හා වෙනත් ප්‍රභූන්ගෙන්ද සිරකරු සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන ඔවුන් සම්බන්ධ විස්තර, තොරතුරු මූලාශ්‍ර යටතේ සදහන් කල යුතුය. (ඇමුණුම සංශෝධිත ක්ෂේත්‍ර විමර්ශන වාර්තාව)

### 3. අධිකාරී වාර්තාව

අධිකාරී වාර්තාව බලපත්‍ර මත සිරකරුවන් මුදාහැරීමේදි අධීක්ෂණ කමිටු වාර්තාව ලෙස සංශෝධනය කෙරේ. කමිටු සාමාජිකයින් සිරකරු බලපත්‍ර මත මුදාහැරීම නිර්දේශ කරනු ලබන්නේ ඒකමතිකවද වෙන් වෙන් වශයෙන්ද යන්න සදහන් කලයුතුය. ඊට ප්‍රථම සුභසාධක නිළධාරී හෝ ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරී විසින් හෝ කරනු ලබන කරුණු සම්බන්ධව වෙනසක් ඇත්නම් පලමුව අධීක්ෂණ කමිටුව නිගමනයකට පැමිණිය යුතුය. ඉන්පසු බලපත්‍ර අධීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ බන්ධනාගාර අධිකාරී විසින් බලපත්‍ර මණ්ඩලයේ ලේකම්, වෙත ඉදිරිපත් කල යුතුය. එම වාර්තා ඉදිරිපත් කිරීමේදි අධිකාරී විසින් බලපත්‍ර ගොනුව පෞද්ගලිකවම අධ්‍යයනය කර එකි තොරතුරු පිලිබදව සැහිමකට පත් වී තම නිර්දේශය සැපයීමට වගබලාගත යුතුය. මෙම වාර්තා ඉදිරිපත් කිරීමේදි නිළධාරීන් විසින් එම තොරතුරු වල නිරවද්‍යතාවය තහවුරු කලයුතු අතර අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව තහවුරු වුවහොත් එම නිළධාරීන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියා කලයුතුය.

### 4. සංක්ෂිප්ත වාර්තාව

අදාල වාර්තා පදනම් කරගෙන බලපත්‍ර මණ්ඩලයේ ලේකම් විසින් සංක්ෂිප්ත වාර්තාව සකස් කෙරේ. සංක්ෂිප්ත වාර්තාවේ සිරකරු සම්බන්ධව ඉදිරිපත් කර ඇති චෝදනාව හා දඩුවම් වගන්තිය හෝ වගන්ති පිලිබදව නිවැරදිව සදහන් විය යුතුය. මෙම වාර්තාවේ දඩුවම යන්න සම්පූර්ණ දඩුවම වශයෙන් සදහන් විය යුතුය. එසේම දඩුවම විස්තරාත්මකව සදහන් කලයුතුය. (දඩුවම් වර්ගිකරණය කර සදහන් කල යුතුය.) නිවාස නිවාඩු යැවීම සම්බන්ධව පසු වාර්තාව සහිත සියළු කරුනු දින වකවානුවන් සමග ඇතුලත් කල යුතු අතර නඩුවට සම්බන්ධ වෙනත් වුදිතයන් සිටි නම් මේ කරුණු වලට අදාලව ඔවුන්ගේ තත්වයද වාර්තා කිරීමට ජ්‍යෙෂ්ඨ සුභසාධක නිළධාරී පෞද්ගලිකව වගබලා ගත යුතුය.

### 3. බලපත්‍ර අධීක්ෂණ කමිටුවේ තිරණය

බලපත්‍ර අධීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කරන සමාජ වාර්තා ගොනුවේ ඇතුලත් කරුණු පිලිබදව බලපත්‍ර මණ්ඩලයේ ඉදිරියට පමුණුවන සිරකරුවන්ගෙන් විමසා තහවුරු කරගත යුතුය. මෙහිදි සිරකරුගේ චරිතය, පූර්ව ක්‍රියාකලාපය, වයස, ශාරීරික හා මානසික තත්වය, වරදේ ආකල්ප ස්වභාවය හෝ බරපතලකම, වරදට පෙලඹුන හේතු, පරිසරය, ඉදිරි පුනරුත්ථාපන වැඩසටහන තුල ක්‍රියාකාරීත්වය, ඉදිරි පුනරුත්ථාපන වැඩපිලිවෙල, සමාජ ආකල්ප, සමාජයට වන යහපත් හෝ අගතිය සහ වෙනත් අවස්ථානුකූල කරුනු සලකා බලා සිරකරු බලපත්‍ර මත මුදාහැරීම පිලිබදව අධීක්ෂණ කමිටුවේ අවසන් තිරණය ගෙන නිර්දේශය සමගින් බලපත්‍ර මණ්ඩලය වෙත ගොනුව ඉදිරිපත් කල යුතුය. මෙම නිදහස් කිරීමේදි සමාජයට සිදුවිය හැකි අගතිය පිලිබදව වඩාත් සැලකිල්ල යොමු කලයුතුය.

ඉහත සඳහන් සංශෝධනයන්ට අමතරව පෙරලත් දඬුවම් පිළිබඳ ප්‍රකාශය, වෛද්‍ය වාර්තාව, සුභසාධක නිලධාරි අවසන් වාර්තාව, ජ්‍යෙෂ්ඨ සුභසාධක නිලධාරි වාර්තාව, සිරකරු වර්ගීකරණය ආදි අනිකුත් වාර්තා ඇතුලත් කර සිරකරුට අදාල සමාජ වාර්තා ගොනුව සකස් කර බලපත්‍ර අධීක්ෂණ කමිටුව හරහා සුදුසුකම් ලබන දිනය වන විට බන්ධනාගාර මූලස්ථානයේ ලේකම්, බලපත්‍ර මණ්ඩලය වෙත එවීමට සුභසාධක නිලධාරීන් හා ජ්‍යෙෂ්ඨ සුභසාධක නිලධාරීන් කටයුතු කලයුතුය. ප්‍රාදේශීය කමිටු නිරීක්ෂක සාමාජිකයින් දැනට පත් කිරීමට කටයුතු කර ඇති අතර ඒ අනුව ඉහත සඳහන් කමිටු දෙක ඔබ ආයතනයේ පිහිටුවා සිරකරුවන් නිවාස නිවාඩු යැවීමටත්, බලපත්‍ර මත මුදාහැරීමටත් අවශ්‍ය ක්‍රියා මාර්ග වහාම ගන්නා ලෙසට මෙයින් දන්වමි. මෙම කරුණු කාරණාවන් සම්බන්ධයෙන් ඔබ පෞද්ගලිකවම අධීක්ෂණය කලයුතු අතර වගකීමෙන් කටයුතු කල යුතු බවද වැඩිදුරටත් දන්වමි.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්